# නිර්මාණ Nirmana



ලිපේ රත්වන අහරවත් නොම
රැගෙන රුපු බල බිඳින අටියෙනි
කපේ මින් පෙර නොකළ සටනක
යෙදී සිරිලක රකින විරුවනි
අ පේ හෙට දින රැක බලාගෙන
ඔබේ අද දින පුදන දරුවනි
ඔපේ නංවා සිහළ දේශය
සිංහකොඩි වැල් ඉහළ එසවුණී

♦ වී. බී. කරුණාරත්න
Oxford UK

## Our Son the Soldier

Our Son the Soldier
How great a man he must be
To be joined in the fight to
set another part of the world free

Our Son the Soldier
So very proud of you we are
To all of us who love you,
you will always be our shining star

Our Son the Soldier
So far from home and in a foreign place
Just close your eyes to
see a familiar smiling face

Our Son the Soldier
So very far away
We will all be waiting with open
arms on your coming home day

♦ Denise Girod

## රණවිරු අභිනන්දන

පා න විකුමන් නීලමහ යෝධයන්
විලසින් රටම රැකුමට
ඕ න තුන් හෙළයේම සිහළුන්
තුති පුදන්නට අපේ සෙබළට
මා න බලමින් සිටින කොළුගැටවුනෝ
හමුදාවට බැඳෙන් නට
දී න නොමවී සිහලයෙකු ලෙස
බොදුකමත් ගෙන එනු ඉදිරියට

ත බ න තබනා සෑම පියවර
වෙතම තෙරුවන්ගේම සරණයි
සොබන හමුදා විරුවනේ නුඹ
උතුර දකුණට රවිඳු කිරණයි
සු ම න තෙද දෙව් කඳකුමරු හා
විෂ්ණු මහ දෙවිඳුගේ සරණයි
පොරණ රජවරු රට සුරැකි ලෙස
රකිනු මේ ඔබ උපන් දෙරණයි

සු ර න් දෙව් ලොව ඉඳන් මේ රට
සතර අත රැකවල් යොදා ගෙන
තෙ දි න් යුතු මහ විෂ්ණු දෙවියෝ
රටත් සසුනත් රකියි නිති යෙන
බෙලෙන් දළදා මහා සමිඳුගෙ
ඔබේ දැතට විරිය දෙව මින
චි ර ං ජීවතු! දැයේ සෙබළුනි
අපේ ආයුෂ ටිකත් අර ගෙන

♦ සුසන්ත ශ්‍රී අතුකෝරාළ
විකිළිය බලන්ගොඩ Sri Lanka

## උපහාර !

නොවේ වෙන ලොවක් අපහට
සදාදර අපේ මව්බිම
මුදාගෙන මිසක් එය රුපු
මකා හෙට දිනේ

වැඩූ දෙස් පෙමක් හද තුළ
කිඳා බැස ඇතේ නොසිඳෙන
ලෙසින් ඔබ තුළෙහි විසිරෙන
තෙදේ සිරි පෙනේ......

හෙළේ විරු පුතුන් පෙර දින
තැබූ අඩි දිගේ ඔබ හැම
නොවී කිසි සැකක් පෙරටම
ඇදී යනු දැනේ......

පෙමාදර අපේ ලක්මව
සිනාමල් මුවේ නංවන
මහා රණ පුතුන් ඔබ ම ය
දිනූ අප සෙනේ......

♦ DAREN
London NW3



## අප වෙනුවෙන් ඔව්හු

අප නිදන කල මැදුර තුළ වැද
ඔව්හු සතුරන් සොයති වන මැද

අප බුදින කල රසැති මසවුල
උනට අහරක් නොමැත නිසි කල

අප නිදන කල සුවැති යහනක
නිදි වරති ගන අඳුරු ලැහැබක

අපේ දෙසවන මියුරු ගී හඬ
ඔවුන් සවනත රුදුරු හෙණ හඬ

කුසීතව මෙහි හිඳිති අප හැම
අභීතව යුද වදිති රණ බිම

රකිනු උදෙසා අපේ හෙට දින
කැප කරති ඔවුනගේ අද දින

♦ සේපාලිකා ජයසිංහ
Middx UK

## අප ඔබ සමගය

ය ම ක් වේද දිවිහිමියෙන් රැකිය යුතු
නි ම ක් වේද එහි ඇති ගුණ ඔබට ගරු
ර ට ක් නේද සිහසුන් මත කරන රජු
හෙටක් වේද වැනසූ කල උන් රුහිරු

පෙර වුන් එකට එක්කර තැනු මුතුමාලා
ලා ගෙල වටට හැඩවෙන්නට හැකි වූවා
නිවට රැලක් ලෙස බිය වැද සැඟ වීලා
හැකිවේද සදන්නට පුදනට මල් මාලා

සාපය නිමාවන්නට හිරු පායන වා
හදවත දුවන ලේ දහරා ඉපිලෙන වා
දරුකැල අපේ හෙට දින රජ කරවනවා
රට වෙනුවෙන් ඔබ හා අපි එක්වෙනවා

♦ සපුමල් බණ්ඩාර අල්විස්
London

## රණවිරු දරුවෙනි !

ත ඹ ව න් පැහැති ලිය පෙරදිග මුතු කුමරී
දු ටු ව න් පිනන මිණිකැට රුවකිය ඔමරී
මෙනයින් පසිඳු මගෙ රුව දැන් ඇත වැහැරී
ක ඳු ලි න් පිරුණු වියපත් හදවත පැහැරී

වැදුවෙමි වීර දරුවන් දෙදහස් වසර
ලැබුවෙමි ඔවුන්ගෙන් රැකවරණය නිතර
දුටුවෙමි පර සතුරු බිය දහ හතර වර
මිදුනෙමි එ හැම වර දරුවෙනි එකක් හැර

එ ව ර ද දිනන්නට මගෙ දරු රණ විරුවෝ
දි වි පු ද කළද එක දරුවෙක් වින කෙරුවෝ
බැම්බැඳ පරයන්ගෙ දෑතට පත් කෙරුවෝ
සිඳ බිඳ එබැමි දැමු පසු බිහිවුණු දරුවෝ

නි ද හ ස් වුනද එම සුව විඳිනට නොහැකී
මගෙ කුස් සෙන් බිහිව දැඩිවුණු මර පුතෙකී
ප ර දෙ ස් සන් සමග එක් වී නොබිය සැකී
මගෙ හිස් ගසා නසනට යොදනා තැතකී

උහු ගෙන් මා මුදා සුවපත් කරන ලෙස
මුහු දට ගොඩ බිමට අහසට එක විලස
යුහු වට යුද වදින්නට රණ බිමට බැස
ලුහු බැඳ රුපුන් පරදනු මැද විජය ගොස

ඔබ හෙලු දහදියෙන් උපදිති මහඟු මුතු
ඔබ හෙලු රුහිරු බිඳුවෙයි මිණි රතට රතු
ඔබ හෙලු කඳුළුළු වෙයි දිය මිණි කැට දිමුතු
ඔබ හෙලු සුසුම් පෙරළෙයි සිනහවට මතු

ජයගෙන රුපුන් මා සුවකළ දිනෙක සිට
කිසි දි න නොදෙන ලෙස අවසර පරයනට
නිවහන තනා කෙත් වපුරා වන්නි රට
සරසන මැනවි මගෙ මහවැළි ඔසරි පොට

♦ වෛද්‍ය උපාලි අබේසිරි
Middx UK

**මෙවර නිර්මාණ පිටුව වෙන්වන්නේ අප රට රකින සන්නද්ධ හමුදාවන් හි රණ විරුවන් වෙනුවෙනි**

## හෙළ වීරපුතුන් යුද වැදුණු කලට......

නිදිමත බඩගිනි තිබහට වතුරත්
නැතිමුත් එඩිතරකම පෙන්නා
සිරිලක් බිම රැකගන්න හිතාගෙන
යුදපිටියේ දස්කම් දන්නා
සෙබළ පුතුන් පණනල ගැන නොසිතා
රට වෙනුවෙන් පෙරමුණ ගන්නා
වීර පැටව් ටික යුද බිම සටනේ
දැ අබිමානය රැක දෙන්නා

දකින විටදි ඔබ ඉදිරියටම යනු
නිබය බවින් හදවත පුරවා
මව් පියවරුනගෙ දෙනෙත පිරී යයි
කඳුලැලි සොම්නසකට හරවා
මහ වැසි මැද ගංවතුරේ ගිලෙමින්
ජය ටැඹ වෙත යන සිහින මවා
හෙළ විරු දරුවන් පෙරටම යන හැඩ
පෙනේ අසිරියෙන් උදය හවා

නමය නපුරු බව කවුරුන් කිව්වත්
දෙදහස් නවයයි උදාවුණේ
දෙදහස් නවයේ අවුරුදු ත්‍යාගය
අලිමංකඩ නිදහස් කෙරුණේ
වීර විකුම් පෑ හසලක ගාමිණී
වසර නවයකට පෙර මැරුණේ
බේරාගන්නයි අලිමංකඩ
කඳවුර අද නැවතත් දිනා ගැනේ

හෙණ හඬ පරදා වෙඩිහඬ පැතිරෙයි
ඒ මව්බිම බේරාගන්නයි
අද සිටි අය හෙට නැත දිවි පුදදී
රණවිරුවන් බල සම්පන්නයි
සටන් නිමා වී රට සන්සුන් වී
දේශයෙ කඳුලැලි වියැලෙන්නයි
තෙරුවන් සරණින් විරු දරු දූ පුත්
හසරැල්ලෙන් ගෙදරට එන්නයි

හමුදාපතිවරු ජනනායකයින්
යුද බිම වෙත ගොස් දිරිය දෙතී
පන්සල් පල්ලි ද කෝවිල් හැම තැන
වීරපුතුන් හට සෙත පුදතී
හැම නිවහනකම සිහ දජ ඔසවා
සිරිලක් භූමිය බබළවතී
වෙඩි හඬ පරදා මල්වෙඩි දල්වා
අද මුළු දේශය සතුටු වෙතී

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## සිංහකොඩිය යට කිරිබත් උයමු අපි

අ ද හස් දරණ නානා විද කොටස් වේ
එ ක් රැ ස් වෙමින් ඒ හැම මුතු පොටක් වේ
තිබු දොස් පහව ගොස් ලස්සන හෙටක් වේ
දෙ ද හ ස් නවේ මේ රට එක රටක් වේ

වංස ජාති පැති වශයෙන් නිතර කිපී
වින්ද ගැහැට ඇති ගිනිබට රැගෙන හැපී
බැන්ද වයිරකම් වල බැමි දෙකට කැපී
සිංහ කොඩිය යට කිරිබත් උයමු අපී

හැම දෙන ඒකීය රට තුළ නිදා සිටී
කිම අද සිහින මවමින් මරු වළේ වැටී
උ ම තුව ගිහින් වන්නියෙ වනපෙතේ කොටී
අ ම තක කරමු හිමිවරු පෙති ගැසූ හැටී

අස් වද්දමින් යුද කළ කුඹුරු මුඩු වුණු
ඉස් සර වගෙම යල මහ ගෙනෙයි කහවනු
ගස් වැල් පවා ගිනි වැද තැළුණු වැලපුණු
ලස් සන වෙලා ඇත පලබරින් සැරසුණු

කෝප යෙ ගිනි නිවී අමුතුම පෙරලිය කින්
දී ප ය එකක් වී සාමයෙ උණුසුම කින්
පා ප ය ගෙවී ගොස් නොසැලිය යුතු බිය කින්
යා ප නයට යන්න හැකි වෙයි බස් රිය කින්

උ ම තුව ගොස් ඇත්තෙ වයිරෙකි අස තුටකී
ස ම ගිය කින් බැඳිය යුතු සාමයෙ වැටකී
අ ම තක කළ යුතුය කෝවත් සටනට කී
හැම ටම අයිති එක කොඩියකි එක රටකී

සතු රන් නැතිව ගොඩ මඩ දෙක සරු වේවී
උතු රෙන් කපන අස්වනු දකුණට ඒවී
මතු වට රට හදන සැලසුම් සැක සේවී
මිතු දම් ලියලමින් සැමය පැති රේවී

අ ව් වැසි පින්න නොතකා ජීවිතය පුදා
කිව් නෙක උරුම සතුරන්ගෙන් රැගෙන මුදා
මව් බිම රැකගත්ත දැහිත ඉවත නොදා
සිව් බල ඇනියටම අප ණයගැතිය සදා

♦ කිවිපති පාතකඩ කුලතිලක
මහරගම Sri Lanka

## රණවිරු දූ පුතුනි !

නු බ තල එකළුවන තරුකැට මෙන් රුවට
පොබ කර දස දහස් සිත් නොබියව පෙරට
ත බ මින දෙපා රක්නා ලක්මව සොඳට
ඹ බ පුත් මහත් අභිමානය වෙයි අපට

නැති මුත් බිම් අහළ කුදු තම උරුම යට
බැ ති මත් ලෙසින් මුළු ලක බිම් රකිනු වට
නි ති දිවි පිදූ ජය ගොස නැංවූ ලොවට
ඉ ති හස පිරුණි ඔබ වැනි විරුවන් නමට

හිරිමල් තුරුණු විය රණ බිම වෙත ගොසින
අතහැර දෙමාපිය සොහොයුරු සොයුරි යන
නින්දක් බතක් නැති මුත් සිත නොසෙල වෙන
ඔබගේ දිරිය පුදුමෙකි අදහනු නොහෙන

ග ම රට දමා නොමදත් දුරු පෙදෙස කට
නොම දැන කුමන ඉරණම වේදැයි හෙටට
ත ම සිතු පරිදි පිය නැගූ යුද බිම වෙතට
ස ම කළ හැකිද ඔබෙ එඩිතර බව කුමට

යහ ප ත් හෙටක් රටකට ගෙන දෙන ලෙසිනී
පැහැපත් ඔබේ හෙට ඒ වෙනුවෙන් පිදුනී
ගු ණවත් දනන් හද ඔබ මතකය නොමිනී
බැ තිමත් පහන් වී දැල්වෙයි සෙනෙ හසිනී

හි ස ගිනි වැදී දන මන අසරණ වෙමිනී
ද ස අත නැගුණු කඳුලෙන් ලක් බිම තෙමුනී
එ ස වෙන සතුරු බල බිඳ සුන්කර ලමිනී
දෙස රැකගන්න හැකි පුත නුඹ හට පමණී

අවුරුදු තිහක යුද අවසන් කරන් නට
මෙය වෙයි මොහොත කඩුපත් ලෙල දෙවන් නට
නොතබා ඉඩක් යළි ලක්මව පෙලන් නට
වනසන් සතුරු කැල පුතුනේ නිමක් කොට

නව හිරු නැගී එත හෙට ලක් අඹර වෙත
ලක්මව සතුටු කඳුලක් පිස දමනු ඇත
රණවිරු දූ පුතුන් දිවි පිදු දෙරණ මත
මල් වී පිපී ලක සුවඳින් පිරෙණු ඇත!

♦ දයා ආනන්ද රණසිංහ

## වීර පුතුන් අපගේ

සිහිවෙයි ගැමුණු නිරිඳුන් ඉතිහාස පොතේ
ඒ නිරිඳුන්ම යළි ලක්බිම ඉපිද ඇතේ
සතුරන් නසා දෙස රැකගත් වීර පුතේ
ඔබගේ දෙපා සිඹිනෙමි භක්තියෙන් සිතේ

♦ නිලේන්ද්‍ර ද කෝස්තා Surrey UK